# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1981/87 - 2016 අගෝස්තු මස 26 වැනි සිකුරාදා - 2016.08.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥපනත (52 වැනි අධිකාරය වූ)**

අංක 989 දරන සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද සුරාබදු ආඥපනතේ (52 වන අධිකාරය වූ) 32 වැනි වගන්තිය සමග කියවිය යුතු 22 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම 2016.09.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ආනයනය කරනු ලබන විදේශීය මත්පැන් සම්බන්ධයෙන් පහත දැක්වෙන රීති ප්‍රකාශයට පත් කරනු ලබන අතර එම මත්පැන් තොග ලීටරයක් සඳහා පහත සඳහන් සුරාබදු පැනවිය යුතු බවට මෙයින් නියම කරමි.

| | | |
|---|---|---|
| (i) | විදේශ ධාන්‍ය මද්‍යසාර සඳහා | රු. 50.00 |
| (ii) | විදේශ වයින් සඳහා | රු. 100.00 |
| (iii) | අනෙකුත් විදේශීය මත්පැන් සඳහා (ඉහත (i) හා (ii) අයත් නොවන) | රු. 200.00 |

රවි කරුණානායක
මුදල් අමාත්‍ය.

2016 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**රීති**

1. යම් පුද්ගලයකු විසින් මත්පැන් ආනයනය කිරීමට අදහස් කරන්නේ නම්, ඔහු මෙහි I උපලේඛනයේ සඳහන් පරිදි අයදුම්පත්‍රයක් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

2. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම්, ඔහු විසින් මෙහි II වැනි උපලේඛනයේ දැක්වෙන ආකෘතිය අනුව වූ අනුමැතිය ආනයන හා අපනයන පාලක වෙත ලබාදිය යුතුය.


1A - PG 3088— 507 (2016/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්නොවන්නේ නම් එම අයදුම්පත්‍රය ලැබී දින පහක් ඇතුලත එය ප්‍රතික්ෂේප කිරීමට හේතු සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් අයදුම්කරු වෙත දැන්විය යුතුය.

4. මත්පැන් ශ්‍රී ලංකා රේගුවට ලැබීමෙන් පසු මෙහි III වැනි උපලේඛනයේ සඳහන් ලිපිය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතික කර, එය එකී ද්‍රව්‍ය නිදහස්කර ගැනීම සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

5. සුරාබදු පිළිබඳව වූ ගාස්තුව ගෙවීමෙන් පසු සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් මත්පැන් ආනයනය සඳහා අවසර පත්‍රයක් සහ එකී ආනයනික මත්පැන් ප්‍රවාහනය සඳහා අවසර පත්‍රයක් ද මෙහි IV හා V උපලේඛනවල සඳහන් ආකෘතිය අනුව නිකුත් කළ යුතුය.

6. සුරාබදු කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද මත්පැන් ආනයනය සඳහා වූ අවසර පත්‍රය බලපත්‍ර ස්ථානයේ දී සුරාබදු නිලධාරීන් විසින් පරීක්ෂා කිරීම සඳහා ඉල්ලූවිට එය ලබාදිය යුතුය.

## *I උපලේඛනය*

### මත්පැන් ආනයනය කිරීම සඳහා වූ අයදුම්පත්‍රය

අයදුම්පත්‍රයේ අංකය :...........................

1. අයදුම්කරුගේ නම : ..........................................................................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................
3. දුරකථන අංකය : ...............................................................................................................
4. විද්‍යුත් තැපැල : ................................................................................................................
5. ලිපිනය :-
   පෞද්ගලික ලිපිනය : ...........................................................................................................
   ව්‍යාපාරික ලිපිනය : ...........................................................................................................
6. බලපත්‍රය ලබා දී ඇති ස්ථානයේ නම : .............................................................................
7. බලපත්‍ර ලබා දී ඇති ස්ථානයේ ලිපිනය : .........................................................................
8. මත්පැන් ආනයනය කිරීමට බලාපොරොත්තු වන රට : .................................................
9. මත්පැන් නිෂ්පාදනය කළ රට : .......................................................................................
   (නාමමාත්‍රික ඉන්වොයිසිය මේ සමඟ ඇමිණිය යුතුය)
10. ආනයනය කරනු ලබන මත්පැන් ලීටර් ප්‍රමාණය : .......................................................
11. මත්පැන් ආනයනය කිරීමට බලාපොරොත්තු වන අදාළ රටෙන් ගෙන්වන මත්පැන් සම්බන්ධව විශ්ලේෂණ වාර්තාව (විශ්ලේෂණ වාර්තාව මේ සමග ඇමිණිය යුතු ය.) : .................................................................
12. මත්පැන් ආනයනය කිරීමට බලාපොරොත්තු වන දිනය : ..............................................

........................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...........................

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

යම් කොන්දේසියක් ඇත්නම් : ..........................................................................................
ප්‍රතික්ෂේප කිරීමට හේතු : ..............................................................................................

මත්පැන් ආනයනය සඳහා අවසර දෙමි/අවසර නොදෙමි/ඉහත කොන්දේසිවලට යටත්ව අවසර දෙමි.

........................
අත්සන හා දිනය
සුරාබදු කොමසාරිස්.

II වන *උපලේඛනය*

අයදුම්පත්‍රයේ අංකය :-
ප්‍රධාන සුරාබදු කාර්යාලය :-

ආනයන හා අපනයන පාලක,
ආනයන සහ අපනයන පාලක දෙපාර්තමේන්තුව
කොළඹ.

**මත්පැන් ආනයනය කිරීම**

.............................................................. (ලිපිනය) පදිංචි................................................................ ජාතික හැඳුනුම්පත් අංක දරන ................................................................................................................................................ (සම්පූර්ණ නම) යන අයට මෙහි පහත සඳහන් මත්පැන් ප්‍රමාණය ආනයනය කිරීම සම්බන්ධයෙන් අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටින අතර එය ආනයනය කර ශ්‍රී ලංකාවට ගෙන ඒමෙන් පසුව රේගු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කිරීමට ප්‍රථම මැත්පැන් සඳහා වූ ආනයන සුරාබද්ද අයකිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි.

නාමමාත්‍රික ඉන්වොයිස් අංකය :............................
තොග ලීටර් ප්‍රමාණය :............................
වලංගු කාලය :............................

දිනය :............................

.........................................
අත්සන.
සුරාබදු කොමසාරිස් ජනරාල්.

*III වන උපලේඛනය*

සුරාබදු කොමසාරිස් ජනරාල්,
ප්‍රධාන සුරාබදු කාර්යාලය,
කොළඹ.

**මත්පැන් ආනයනය කිරීම**

ආනයන අපනයන පාලකගේ අංක............................................. දරන බලපත්‍රය යටතේ....................................................... .....................................................පදිංචි...................................................................................... ජාතික හැඳුනුම්පත් අංක .................... දරන.. .....................................................................(සම්පූර්ණ නම) විසින් මෙරටට ආනයනය කරන ලද මත්පැන් ප්‍රමාණය................... (ලීටර්) ක් නිකුත් කිරීමට සූදානම් බවත් ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙසත් ප්‍රකාශ කරමි.

බහාලුම් අංකය :............................
ප්‍රමාණය තොග ලීටර් :............................
වෙනත් කරුණු :............................

දිනය :............................

..........................................
බලයලත් රේගු නිලධාරියාගේ අත්සන.
බලපත්‍ර අංකය :............................

*IV වන උපලේඛනය*

**මත්පැන් ආනයනය සඳහා වූ බලපත්‍රය**

අයදුම්පත්‍රයේ අංකය :.....................................................

1. අයදුම්කරුගේ නම/ආයතනය :.....................................................................................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය :.....................................................................................................................
3. ලිපිනය

   පෞද්ගලික ලිපිනය :.....................................................................................................................

   ව්‍යාපාරික ලිපිනය :.....................................................................................................................
4. දුරකථන අංකය :.....................................................................................................................
5. විද්‍යුත් තැපැල :.....................................................................................................................
6. බලපත්‍රය ලබා ගන්නා අරමුණ :.....................................................................................................................
7. ආනයනය කරනු ලබන නිෂ්පාදනයේ සඳහන් විස්තරය :.....................................................................................................................

| *බහාලුම් අංකය* | *මත්පැන් වර්ගය* | *සැර ප්‍රමාණය* | *තොග ලීටර් ප්‍රමාණය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

8. මාර්ගය :.....................................................................................................................
9. මත්පැන් ගෙනයනු ලබන ස්ථානයේ නම හා ලිපිනය :.....................................................................................................................
10. කාල පරාසය :.....................................................................................................................
11. වෙනත් කරුණු :.....................................................................................................................
12. දිනය :.....................................................................................................................

....................................

බලයලත් සුරාබදු නිලධාරී

*V වන උපලේඛනය*

**මත්පැන් ප්‍රවාහනය සඳහා අවසර පත්‍රය**

බලපත්‍ර අංකය :...............................

1. බලපත්‍ර හිමියාගේ නම :..........................................................................................................
   ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................................
   ලිපිනය
   පෞද්ගලික ලිපිනය :..........................................................................................................
   ව්‍යාපාරික ලිපිනය :..........................................................................................................
   දුරකථන අංකය :..........................................................................................................
   විද්‍යුත් තැපැල :..........................................................................................................
2. රියදුරුගේ නම :..........................................................................................................
   ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................................
   ලිපිනය
   දුරකථන අංකය :..........................................................................................................
3. බලපත්‍ර ස්ථානයේ නම/ලිපිනය :..........................................................................................................
4. මත්පැන් වර්ගය :..........................................................................................................
5. සැර ප්‍රමාණය :..........................................................................................................
6. ප්‍රමාණය :..........................................................................................................
7. මාර්ගය :..........................................................................................................
8. කාලසීමාව :..........................................................................................................
9. වෙනත් කාරණා :..........................................................................................................
10. දිනය :..........................................................................................................

යම් කොන්දේසියක් ඇත්නම් ..........................................................................................................

..........................................................................................................

මත්පැන් ප්‍රවාහනය සඳහා ඉහත කොන්දේසිවලට යටත්ව අවසර දෙමි.

.....................................................
අත්සන හා දිනය.
සුරාබදු කොමසාරිස් ජනරාල්.

09-469

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.